සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - චිත්‍ර කලාව

අගෝස්තු 03 සතිය

ශ්‍රේණිය - 10 (III වාරය)

සැකසුම - රූපිකා ජයන්ති (සිරිසමන් ජා. පා.)
දැරණියගල කොට්ඨාසය

පාඩම/ඒකකය - 2.2.4 ඝනක හැඩැති වස්තුවක්, ගුරුලේත්තුවක බහාලූ මල් අත්තක්, වට්ටක්කා ගෙඩියක් සම්පිණ්ඩනය කර ඇඳීම

## ඝනක හැඩැති වස්තුවක්, ගුරුලේත්තුවක බහාලූ මල් අත්තක්, වට්ටක්කා ගෙඩියක් සම්පිණ්ඩනය කර ඇඳීම

1. ඉගෙනුම් ආධාරක

- ද්‍රව්‍ය සම්පිණ්ඩන තුනක් ඔබට ලබා දී ඇත





2. ක්‍රියාකාරකමෙහි නිරත වීමට උපදෙස්

- ඔබට ලබා දී ඇති ද්‍රව්‍ය සම්පිණ්ඩන එක එකක් හොඳින් නිරීක්ෂණය කරන්න
- විවිධ හැඩතල ඇති බව
- ඒවා විවිධ පරිමාණ ගන්නා බව
- පර්යාලෝකය දැක්වෙන ලෙස ඇඳ තිබීම
- ත්‍රිමාණ ලක්ෂණ දැකිය හැකි බව (එළිය, අඳුර දක්වා ඇති බව)
- ගැඹුරක් පෙනෙන බව (ද්‍රව්‍ය අතර)
- විවිධ හැඩතල, භාණ්ඩවලට විවිධ ගති ලක්ෂණ ඇති බව ඔබට හඳුනාගත හැකි ය

3. ඇගයීම

1. අඳින ලෑල්ල මත තබන ලද ඝනකයක්, මල් අත්තක් ගුරුලේත්තුවකට දමා, වට්ටක්කා හෝ ගස්ලබු ගෙඩියක් ඔබ ඉදිරියේ තබා ඇතැ යි සිතා (ආදර්ශ රූපවලට අනුව) රේඛාවෙන් ගොඩනගා ගන්න.

2. පරිමානුකූලව, නිවැරදිව අඳින්න.

3. ඇඳීමේ දී එකිනෙකට භාණ්ඩ ආවරණය වුව ද ඒවා ද අඳින්න.

4. ඉන්පසුව ඔබට පෙනෙන හැඩතල පමණක් ඉතිරි වන සේ අනික් ඒවා මකා ගන්න.

5. පර්යාලෝක ලක්ෂණ කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන්න.

6. මල් සහිත කොළ අත්තෙහි ස්වාභාවික පෙනුම, කොළ අතුවල විහිදීම, මෘදු මොලොක් ගති ස්වභාවය මතුකර ගන්න.

7. ගුරුලේත්තුවේ වටකුරුබව මතුවන සේ අඳින්න.

8. පැස්ටල් හෝ දියසායම් මාධ්‍යයෙන් වර්ණ කරන්න.

9. පසුතලය වර්ණ ගැන්වීමේ දී ද්‍රව්‍ය සමූහය වඩාත් හොඳින් මතු වී පෙනෙන සේ වර්ණ යොදන්න.

10. පැය දෙකක කාලයක දී චිත්‍රය නිම කරන්න.